# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1888/12 - 2014 නොවැම්බර් මස 11 වැනි අඟහරුවාදා - 2014.11.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය :* IR/13/29/2011.

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2014.01.02 දිනැති හා අංක 1843/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2013.12.23 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මොදරවාන, පල්ලෙවාව්ව, "ප්‍රිය සෙවන" හි පදිංචි එස්. පී. ඩී. පියදාස මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2014.08.17 වැනි දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

හේරත් යාපා,
කම්කරු කොමසාරිස්.

2014 නොවැම්බර් මස 03 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*යොමු අංකය :* IR/13/29/2011.

**කාර්මික අධිකරණයේ දී ය**

එස්. පී. ඩී. පියදාස මයා,
"ප්‍රිය සෙවන",
පල්ලේවාව්ව,
මොදරවාන.

පළමු පාර්ශවය

නඩු අංකය : A 3532 සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

දෙවන පාර්ශවය

**අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධවයි**

**ප්‍රදානය**

කම්කරු සහ කම්කරු සබඳතා ගරු අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යාවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමාට පැවරී ඇති බලතල අනුව, උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් 2013.12.23 වැනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ -

1 A – G 20577— 25 (2014/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ තංගල්ල ඩිපෝවේ රියදුරෙකු ලෙස සේවය කළ එස්. පී. ඩී. පියදාස මහතාගේ වැඩ තහනම් කර තිබූ (2009.11.01 සිට 2010.05.16 දින දක්වා) කාලයට වැටුප් නොගෙවීමෙන් ඔහුට අසාධාරණයක් සිදු වී ඇත්ද යන්න සහ එසේ අසාධාරණයක් සිදුව ඇත්නම් ඔහු වෙත ලැබිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ."

02. කාර්මික ආරවුල් පනත යටතේ පනවා ඇති රෙගුලාසි යටතේ පාර්ශවයන් විසින් ඉදිරිපත් කොට ඇති ප්‍රකාශ සහ ප්‍රතිප්‍රකාශ බේරුම්කරනයට ඉදිරිපත් කිරීමෙන් පසු පරීක්ෂණය සඳහා 2014.04.08 වැනි දින පාර්ශවයන් කැඳවන ලදී. එදින ඉල්ලුම්කරු වෙනුවෙන් නියෝජිත පී. එම්. තිලකසිරි මහතාත්, වගඋත්තරකාර පාර්ශවය වන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥ අකලංක බාලපටබැඳි මහතා පෙනී සිටින ලදී.

03. ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කරන ලද ලියකියවිලි අනුව ඉල්ලුම්කරු 2009.04.28 වැනි දින තංගල්ල ඩිපෝවට අයත් ස්ථිර රියදුරෙකු වශයෙන් සේවය කරමින් සිටියදී ඒ සම්බන්ධයෙන් 2009.11.01 වැනි දින සිට 2010.05.17 වැනි දින දක්වා සේවා තහනමකට ලක් වී සිටි අතර, ඔහුට විරුද්ධව පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයේදී ඔහු එම චෝදනාවෙන් නිදහස් කරන ලද බැවින් මේ පිළිබඳව කම්කරු කොමසාරිස් (කාර්මික සම්බන්ධතා) වෙත පැමිණිලි කිරීමෙන් පසුව වැඩ තහනමට ලක් වූ කාලයට ඔහුගෙන් අඩු කර ගන්නා ලද වැටුප් ඔහුට ගෙවන ලෙස කම්කරු කොමසාරිස්ගේ නියෝගය අනුව වගඋත්තරකාර පාර්ශවය එසේ නොගෙවීම නිසා බේරුම්කරණය ඉදිරියේ අංක ඒ/3532 දරන නඩුව ගොනු කරන ලදී. ඉල්ලුම්කරුට අදාළ වැටුප් නොගෙවීම අසාධාරණ බැව් බේරුම්කරණයේදී තහවුරු වූ බවට වගඋත්තරකාර පාර්ශවය එකඟ වූ බැවින් ඉල්ලුම්කරුට ගෙවිය යුතු මුදල අනුමත කර ගෙවීමට වගඋත්තරකාර පාර්ශවයට කල් ලබා දෙන ලදී.

04. ඒ අනුව 2014.08.11 වැන දින දෙපාර්ශවයේ එකඟත්වයෙන් ඉල්ලුම්කරුට රු. 115,696/-ක මුදලක් ගෙවීමට ගමනාගමන මණ්ඩලය එකඟ වූයෙන් එම මුදල මහජන බැංකුවේ අංක 1141001900112838 දරන චෙක්පත මගින් විවෘත අධිකරණයේදී ඉල්ලුම්කරුට භාර දෙන ලදී. මෙම මුදල භාරගත් බවට ඉල්ලුම්කරු එස්. පී. පියදාස මහතාත්, ඔහුගේ නියෝජිත ටී. එම්. තිලකසිරි මහතාත් ගමනාගමන මණ්ඩලය වෙනවෙන් නීතිඥ ඒ. ඩී. සී. දර්ශන මහතාත් සමථයට අත්සන් තබන ලදී.

05. මෙම සමථය සාධාරණ සමථයක් බව මා පිළිගන්නා අතර, එය ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා කම්කරු කොමසාරිස් ජනරාල්වරයාට යවන ලෙසද නියෝග කරමි.

ටී. පියසෝම,
(බේරුම්කරු).

2014 අගෝස්තු මස 17 වැනි දී ය.

11-757

---

*මගේ අංකය :* IR/13/17/2009.

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.12.29 දිනැති හා අංක 1738/31 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2010.12.23 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මුලටියන, දිද්දෙනිපොත, අංක 50/1හි පදිංචි රත්න බන්දුල සමරනායක මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2014.07.25 වැනි දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

හේරත යාපා,
කම්කරු කොමසාරිස්.

2014 නොවැම්බර් මස 02 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*යොමු අංකය :* IR/13/17/2009.

**කාර්මික අධිකරණයේ දී ය**

*එක් පාර්ශවයක් වශයෙන්*

රත්න බන්දුල සමරනායක මහතා,
අංක 50/1,
දිද්දෙනිපොත,
මුලටියන.

එදිරිව

නඩු අංකය : ඒ/3426 *අනෙක් පාර්ශ්වය වශයෙන්*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

වගඋත්තරකාර පාර්ශවය

**ප්‍රදානය**

වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන)

පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තියෙන් ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමාට පැවරී ඇති බලතල අනුව, ඉහත පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු ලෙස 2010.12.23 වැනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

එකී ආරවුල ලෙස සඳහන් වනුයේ "ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මුලටියන ඩිපෝවේ ගබඩා පාලකවරයා ලෙස සේවය කළ රත්න බන්දුල සමරනායක මහතා 2007.08.04 වැනි දින ඩිපෝ භූමිය තුළ බස් රථයක් පැදවීමේ සිද්ධිය සම්බන්ධව වරදකරුවෙන් වන්නේ ද සහ 2007.08.04 වැනි දින සිට 2009.11.01 වැනි දින දක්වා වැටුප් අහිමි වීම යුක්තිසහගත වන්නේ ද ? ඔහු වරදකරුවෙන් නොවන්නේ නම් කුමන සහනයක් හිමිවිය යුතු ද ?'' යන්නයි.

පූර්වෝක්ත කාර්මික ආරවුල සම්බන්ධයෙන් කාර්මික ආරවුල් පනතේ සම්පාදිත නියෝග ප්‍රකාරව දෙපාර්ශවයේ සවිස්තරාත්මක ප්‍රකාශ කැඳවා හුවමාරු කරවීමෙන් පසු ඉහත යොමුව කෙරෙහි දෙපාර්ශවයේ සමතයක් වෙත්දැයි විමසන ලදුව, එවැනි සමථයක් නොමැති බැව් හෙළි වූයෙන් විභාගය ආරම්භ කරන ලෙසට ඉල්ලුම්කරු වෙත නියෝග කළෙමි.

ඉල්ලුම්කරු වෙනුවෙන් නියෝජිත මහතෙකු පෙනී සිටි අතර, වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් රජයේ නීතිඥවරියක පෙනී සිටියහ. මූලික ප්‍රශ්න, හරස් ප්‍රශ්න, නැවත ප්‍රශ්න ආදී වශයෙන් විධිමත් විභාගයක ඇතුළත් සියළු අංක මෙම පරීක්ෂණයේදී අනුගමනය කෙරිණි.

ආරම්භයේදීම ඉල්ලුම්කරු සිය නඩුව ඉදිරිපත් කරමින් 1995 වර්ෂයේ වගඋත්තරකාර ආයතනයේ කොන්දොස්තරවරයකු ලෙස සේවය ආරම්භ කළ බවත්, 2004 වර්ෂයේ ගබඩා පාලකවරයෙකු ලෙස උසස්වීමක් ලත් බවද, තමාගේ රාජකාරිය උදේ 8.00 පැය සිට පස්වරු 5.00 දක්වා බවත්, 2007.08.04 වැනි දින බස් රථයක් අනවසරයෙන් පැදවීම සම්බන්ධයෙන් චෝදනා පත්‍රයක් තමාට එරෙහිව ලැබුණු බවද, එම සිද්ධිය සම්බන්ධයෙන් සිය තහනමකට ලක් කොට වගඋත්තරකරුගේ මානව සම්පත් කළමනාකරුගේ ලිපියක් ලැබුණු අතර, ඊට එරෙහිව තමන් වගඋත්තරකාර ආයතනයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගෙන් විනය පරීක්ෂණයක් පවත්වන ලෙස නියෝග ලැබුණු බවත්, එකී ලිපිය A/01 ලෙස ලකුණු කොට ඉදිරිපත් කරමින් ප්‍රකාශ කළේය.

තමාට එරෙහි චෝදනා පත්‍රය බල රහිත පුද්ගලයෙකු එනම්, සහකාර ධාවන කළමනාකාර විසින් සිය චෝදනා පත්‍රය අත්සන් කොට තිබීම විනය විරෝධී වන බව හෙළි කළේ ය.

අදාළ ලේඛනය A/01 ලෙස සලකුණු කොට ඇත.

A/02 ලෙස සලකුණු කරන ලද චෝදනා පත්‍රය හක්මන ඩිපෝ අධිකාරී අත්සන් කොට ඇති බවත්, 01 වන චෝදනාවට අනුව "ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ හක්මන ඩිපෝවේ පළපුරුදු ගබඩා පාලක මහතෙකු වශයෙන් ඔබ 2007.08.24 වැනි දින සේවය නිමා කර සිටියදී මුලටියන ඩිපෝ භූමිය තුළදී අනවසරයෙන් අංක 61-9260 බස් රථය පැදවූවෙහිය " යන චෝදනාවට ලක් කොට ඇත.

මෙම චෝදනාවෙහි නිශ්චිත වේලාවක් සඳහන් කර නොමැත. "සේවය නිමා කර සිටියදී " යන්න නිශ්චිත කාලයක් සඳහන් කිරීමක් නොවේ. ඉල්ලුම්කරු 2007.08.24 වැනි දින 13.00 පැයට සේවය අවසන් කොට නිවස කරා ගිය බවට සාක්ෂි ලබා දී ඇති අතර, වගඋත්තකරු විසින් ලංගම හක්මන, මුලටියන ඩිපෝවේ 2008.08.04 වැනි දින පැමිණීමේ ලේඛනය R/01 ලෙස සලකුණු කොට ඉදිරිපත් කර ඇත. එදින ඉල්ලුම්කරුගේ පැමිණීම R/01A ලෙසත්, සේවයේ පිටවීම R/01B ලෙසත් සඳහන් කොට ඇත. ඒවා අනුව උදේ 8.00 පැයට සේවයට වාර්තා කළ ඉල්ලුම්කරු 13.00 පැයට සේවයෙන් මිදී නිවස කරා පිටත්ව ගිය බවට සටහන්ද, නැවත සේවයට පසු දින පැමිණි බවටද සාක්ෂි දෙයි.

චෝදනා පත්‍රයෙහි චෝදනාවට ලක් වූ කරුණ සම්බන්ධයෙන් නිශ්චිත හා නිවැරදි වේලාවක් සඳහන්ව නොතිබීම අවිධිමත් චෝදනා පත්‍රයක් බැව් පැහැදිලි වේ. චෝදනා පත්‍රයක් විධිමත් විනය නිලධාරියෙකු විසින් අත්සන් කර තිබිය යුතු වන අතර, එහි චෝදනාවල පැහැදිලිව කරන ලද වරද, ස්ථානය, දිනය හා වේලාව ආදී කරුණු පැහැදිලිව සඳහන් විය යුතුව ඇත. එහෙත් මෙම A/02 නමැති චෝදනා පත්‍රයට ඉහත අංග ඇතුළත්ව නොමැති බවට ඉල්ලුම්කරුගේ නියෝජිත මහතා තර්ක කොට ඇත. එය අවිධිමත් චෝදනා පත්‍රයක් බවට පිළිගනිමි.

තවද චෝදනා පත්‍රයට බල රහිත පුද්ගලයකු අත්සන් කර තිබීම හේතු කොට ගෙන ද එකී චෝදනා පත්‍රය ඉවත ලිය යුතු බවට තර්කයක් ඇත. එයද පිළිගත යුතුව ඇත.

දෙවන චෝදනාව අනුව අසත්‍ය ප්‍රකාශයක් ආරක්ෂක අංශයට දුන් බව වරදක් කොට ඇත. එහෙත් ඉල්ලුම්කරු පවසා සිටිනුයේ සත්‍ය ප්‍රකාශයක් තමා විසින් දුන් බව ය.

ඉල්ලුම්කරු චෝදනා පත්‍රයෙහි අඩංගු බස් රථයක් පැදවූ බවට වූ චෝදනාව සනාථ කිරීම සඳහා අදාළ බස් රථයේ රියදුරු වූ තිලකරත්න නමැති අය මුල් විනය පරීක්ෂණයට සාක්ෂි සඳහා ඉදිරිපත් නොවූ අයෙකි. ඊට හේතු විමසද්දී ඔහු ප්‍රකශ කලේ අදාළ විනය පරීක්ෂණයේ දී සාක්ෂි දීමට තමාට නොහැකි වූයේ එම දිනයේම තමාට මහාධිකරණ නඩුවක් සඳහා පෙනී සිටීමට සිදු වූ බැවිනැයි සාක්ෂ්‍යාත් කළේ ය. එම කරුණ ලේඛන මගින් සනාථ කරන ලෙස අවවාද කලද, එය එකී සාක්ෂිකරු පැහැර හරින ලදී. එසේ හෙයින් වගඋත්තරකරුගේ එකී සාක්ෂිකරු විශ්වසනීයත්වයෙන් තොර බවට තර්කයක් පැන නැගිණ. තිලකරත්න නමැති රියදුරු තැන විනය පරීක්ෂණයේදී සාක්ෂි නොදීම සම්බන්ධයෙන් දින 05ක වේතන දඩයක් ඔහුට වගඋත්තරකාර පක්ෂය මගින් නියම කොට ඇත.

විනය විභාග නිලධාරිවරයාගේ වාර්තාව A/03 නම් වේ. චෝදනා පත්‍රයට අදාළ සිද්ධිය නිර්නාමික ලිපියක් මත පරීක්ෂණ ආරම්භ කළ බවත්, සිද්ධිය සියැසින් දුටු එකම පුද්ගලයා අදාළ බස් රථයේ රියදුරු තිලකරත්න මහතා බවත්, ඔහු විනය පරීක්ෂණයට සහාභාගී

නොවූ බවත්, හෙළි වේ. 61-9260 දරන බස් රථය ඉන්ධන ගබඩාව වෙත ඉන්ධන ලබා ගැනීම සඳහා පැදවූ තිලකරත්න රියදුරු ලබා ලත් ඉන්ධන ප්‍රමාණය සංඛ්‍යාත්මක වශයෙන් හෙළි කිරීමට අපොහොසත් වූ බවද පරීක්ෂණ වාර්තාවේ සඳහන් වෙතැයි සාක්ෂිකරු එනම්, මෙම නඩුවේ ඉල්ලුම්කරු සාක්ෂ්‍යාත් කළේ ය.

ඉල්ලුම්කරු අනවසරයෙන් බස් රථය පැද වූ බවට එදින ලොග් සටහනක හෝ උපදෙස් ලේඛනයේ තබන ලද සටහනක හෝ ඩිපෝ කළමනාකරුට වාර්තා කිරීමක් හෝ ලේඛනගතව නොතිබීමෙන් ඉහත කී චෝදනාව සනාථ කිරීමට ගත යුතු වූ පියවර ගණනාවක් මග හැර තිබීමෙන් ඉල්ලුම්කරුට එරෙහි චෝදනාව ඔප්පු කිරීමට අපොහොසත්ව තිබේ.

A/05 ලෙස සලකුණු කරන ලද විනය නියෝගයද එහි අත්සන යොදා ඇති ඩිපෝ කළමනාකරුට A/05A අනුව විනය නියෝගයට අත්සන් යෙදීමට ඩිපෝ කළමනාකරුට බලය නොමැත. ලංකා ගමනාගමන මණ්ඩලයේ විනය ව්‍යවස්ථාවේ 4:10 වගන්තිය අනුව විනය නියෝගයකට "නිසි බලධාරියා " විසින් අත්සන් තබා යැවිය යුතුය යන්න මෙහිදී උල්ලංඝනය වී ඇත.

අභියාචනා නියෝගය ද අත්සන් කොට ඇත්තේ ඩිපෝ කළමනාකරු වේ. එහෙත් විනය ව්‍යවස්ථාව අනුව එයද අත්සන් කළ යුත්තේ "නිසි බලධරයා " විසින් වේ. එයද මෙම ඉල්ලුම්කරුගේ වාසියට පවත්නා වගඋත්තරකරුගේ දුබලතාවයක් වේ.

ඉල්ලුම්කරු වෙනුවෙන් A/01 සිට A/10 දක්වා ලේඛන සලකුණු කොට ඉදිරිපත් කර ඇත.

වගඋත්තතරකරුගේ නීතිඥතුමිය R/01 වශයෙන් සලකුණු කරන ලද ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2007.08.04 වැනි දිනැති සේවක පැමිණිමේ ලේඛනය අනුව එහි R/01A කොටසින් මෙම නඩුවේ ඉල්ලුම්කරු අංක 22න් හැඳින්වෙන අය වේ. ඔහු පෙ. ව. 8.00 පැයට සේවයට වාර්තා කොට පිටව ගිය බවද දැක්වේ. ඉල්ලුම්කරු සමග එම පැයටම තවත් සේවක මහතුන් 06 දෙනෙකු සේවයෙන් බැහැර වූ බවත්, 15.00 පැයට තවත් සේවක මහතෙකු පිටව ගිය බවටත්, අනු අංක 38 දරන සේවකයකු 16.00 පැයට සේවයට වාර්තා කොට ඇති බවත්, අනු පිළිවෙල අනුව මෙම ඉල්ලුම්කාර සේවක තැන 13.00 පැයට ඉවත්ව ගිය බවත්, එකී සටහන් අනුව පැහැදිලි වේ. ඒ අනුව පසුව වෙනත් වේලාවක පිට නොවූ බවට සාධක පවතී. මෙසේ ඉවත්ව ගිය පසුව නැවත සේවයට පසු දින පෙරවරු 8.00 පැයට වාර්තා කල බවද සිය සාක්ෂියේදී ඉල්ලුම්කරු පිළිගෙන ඇත. වගඋත්තරකරුගේ මෙම ලේඛනය ඉල්ලුම්කරුගේ පැමිණිම හා පිටවීම සාක්ෂ්‍යාත් කර තිබීමෙන් චෝදනා පත්‍රයට අදාළ නොවන පරිදි ඔහු සේවයෙන් පිටවූ බවද පැහැදිලි වේ.

R/02 වශයෙන් සලකුණු කරන ලද "සේවක පිරිස, ශ්‍රී ලංගම, හක්මන ඩිපෝව '' යන පාර්ශවය විසින් 2007.08.08 වැනි දිනෙන් "ශ්‍රී ලංගම ප්‍රාදේශීය ආරක්ෂක කර්යාලය - ගාල්ල " වෙත යොමු කරවන ලද නිර්නාමික පෙත්සමෙහි "2007.08.04 වැනි දින 18.20 පැයට 61-9260 දරන බස් රථය ඩිපෝවේ සිටින නිලධාරී මහතුන් සහ සේවක මහතුන් ඉදිරිපිට එලවන්න පුරුදු වුණු අතර,.......රත්න බන්දුල"........ යන ලිපිය චෝදනාවේ සඳහන් නොවූ වරද කරන ලද වේලාව හා ස්ථානය පැහැදිලිව සඳහන් වෙතත්, එකී වේලාව තුළ ඉල්ලුම්කරු සේවයෙන් ඉවත්ව සිටි බව වගඋත්තරකරුගේ R/01 ලේඛනයෙන් පැහැදිලි වේ. මේ අනුව R/01 ලේඛනය මෙන්ම R/02 ලේඛනය ද ඉල්ලුම්කරුගේ වාසියට ඉදිරිපත්ව තිබෙන බැව් පැහැදිලිය.

වගඋත්තරකාර පාර්ශවයේ නීතිඥවරියගේ ලිඛිත දේශනයෙහි සම්ප්‍රකාශයෙහි "මෙහිදී ඉල්ලුම්කරු වෙනුවෙන් ඔහුගේ ප්‍රකාශය හැරුණු විට වෙනත් කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කර නොමැති අතර, ඔහු අදාළ වරද නොකල බවට ඔහුගේම හුදු ප්‍රකාශය හැරුණු කොට වෙනත් සාක්ෂි මගින් ඔහුගේ ස්ථාවරය ඔප්පු කිරීමට අපොහොසත් වී ඇත " යන්න පිළිගත නොහැකිය. ඉල්ලුම්කරු සිය සාක්ෂියේදී වගඋත්තරකාර පාර්ශවය කරන ලද ඌනතා, බල රහිත පුද්ගලයින්ගේ අත්සන යෙදීමෙන් කරන ලද වරදතා, වගඋත්තරකරුගේ සාක්ෂිකරුවන් කරන ලද වරදවල් ආදිය මානම ඔප්පු කොට ඇත. තවද චෝදනා පත්‍රයෙහි බල රහිත අය අත්සන යෙදීමෙන් චෝදනා පත්‍රයම අකර්මන්‍යතාවයට පත් වූ ආකාරයත්, එහි බල රහිත අභියාචනා නියෝග පැනවීමත් ආදිය පැහැදිලිව ඔප්පු කොට ඇති බැවින් ඉහත ප්‍රකාශය පිළිගත නොහැකි වේ. තවද වගඋත්තකරුගේ R/01 සහ R/02 ලේඛන මගින් ඉල්ලුම්කරු චෝදනා පත්‍රයේ සඳහන් වරද සිදු කරන කාල පරාසය තුළ ඔහු සේවයෙන් මිදී ගොස් ඇති බවට සාක්ෂි "එනයින්ම අවබෝධ "වන සේ ඉදිරිපත්ව ඇත.

ඉහත දක්වන ලද කරුණු අනුව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මුලටියන ඩිපෝවේ ගබඩා පාලකවරයා ලෙස සේවය කල රත්න බන්දුල සමරනායක මහතා 2007.08.04 වැනි දින ඩිපෝ භූමිය තුළ බස් රථයක් පැදවීමේ සිද්ධිය සම්බන්ධව වරදකරුවෙක් නොවන බවත්, 2007.08.04 වැනි දින සිට 2009.11.01 වැනි දින දක්වා වැටුප් අහිමිවීම යුක්තිසහගත නොවන බවත් තීරණය කරයි.

ඔහු වරදකරුවෙන් නොවන බැවින් අදාළ ඉල්ලුම්කරුට මාස 02ක සේවය අත්හිටුවීම හේතු කොට ගෙන ඇති වූ මූල්‍යමය පාඩුව සඳහා රු. 25,410/- ක මුදලක් ද 2009 වර්ෂයේ ප්‍රසාද දීමනාව වෙනුවෙන් රු. 1,000ක් ද, සමග නඩු ගාස්තු සහ සියළු වියදම් සඳහා රු. 4,000/-ක් ද සමග එකතුව මුළු මුදල රු. 30,410ක් මෙම ඉල්ලුම්කාර රත්න බන්දුල සමරනායක මහතාට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයෙන් මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී මසක් ඇතුළත ගෙවිය යුතු බවටත්, තීරණය කරමි.

මෙය අපක්ෂපාතී, යුක්තිසහගත ප්‍රදානයක් බවට සහතික කරමි.

එස්. කාරියවසම්,
(බේරුම්කරු).

2014 ජූලි මස 25 වැනි දී ය.

11-758

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.